# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 3 දරන ලංකා ළමා හා යෞවන රඟහල පදනම (සංස්ථාගත කිරීමේ)

---

[සහතිකය සටහන් කළේ 2007 ජනවාරි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 පෙබරවාරි මස 2 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2007 අංක 3 දරන ලංකා ළමා හා යෞවන රඟහල පදනම (සංස්ථාගත කිරීමේ)

[සහතිකය සටහන් කළේ 2007 ජනවාරි මස 29 වන දින]

එල්. ඩී.—ඕ.අයි.එන්.සී. 14/2004.

## ලංකා ළමා හා යෞවන රඟහල පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ප්‍රජාව තුළ සක්‍රිය ලෙස ක්‍රියාකළ හැකි පැහැදිලි සංස්කෘතික අනන්‍යතාවයක් සහිත තුලිත තැනැත්තකු විය හැකි මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වූ ළමයකු වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන්, රංගන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ, අනුග්‍රහය කිරීමේ සහ සම්බන්ධීකරණය කිරීමේ කාර්යය සඳහා "ලංකා ළමා හා යෞවන රඟහල පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති හෙයින් ද, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියළු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා මෙතෙක් කල් සිදුකර ඇති හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ඒ සංගමය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 3 දරන ලංකා ළමා හා යෞවන රඟහල පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා ළමා හා යෞවන රඟහල පදනමේ දැනට සාමාජිකයන්ව සිටින්නා වූ සියළුම තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා ළමා හා යෞවන රඟහල පදනම යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නමින් සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද සියළු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය කැමැත්ත පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. ලංකා ළමා හා යෞවන රඟහල පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය පරමාර්ථ.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) ශ්‍රී ලංකාවේ ළමයින් හා යෞවනයන් සඳහා රංගන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, අනුග්‍රහය දැක්වීම සහ සම්බන්ධීකරණය කිරීම ;

(ආ) අවශ්‍යතාවය අනුව ළමයින්ගේ හා යෞවනයන්ගේ මානසික හා භෞතික යන දෙපැත්තෙන් ම වර්ධනයට සුදුසු පරිසරයක් සැලසීම හා නිර්මාණය කිරීම ;

(ඇ) සමාජය තුළ සතුටුදායක ලෙස ක්‍රියා කළ හැකි තම තමන්ගේ සංස්කෘතික උරුමය හා අනන්‍යතාවය පිළිබඳ මනාව දියුණු වූ අවබෝධයක් ඇති ප්‍රීතිමත් තුලිත තැනැත්තන් ලෙස ළමයින් හා යෞවනයන් පුහුණු කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ ළමයින් හා යෞවනයන් අතර, බහුවාර්ගික සමගිය වැඩිදියුණු කිරීම ;

(ඉ) අදහස්, දැනුම සහ පළපුරුද්ද හුවමාරු කර ගැනීමේ පහසුකම් සැලැස්වීමේ අරමුණ ඇතුළු සමාන පරමාර්ථ ඇති වෙනත් පුද්ගල මණ්ඩල සමග සම්බන්ධවීම සහ එක් වී කටයුතු කිරීම ;

(ඊ) ඉහත කී පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය හෝ ආනුෂංගික වන වෙනත් සියලු දේවල් කිරීම,

යනාදිය වේ.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ ද එකතු කිරීමේ ද වෙනත් යම් මණ්ඩල හෝ ආයතනවලින් හෝ රජය මගින් වෙනත් ආධාර, ප්‍රදාන සහ පරිත්‍යාග සොයා ගැනීමේ, ලබාගැනීමේ හෝ එක්රැස් කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, සේවක පිරිස් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටුකිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදවීමේ ද බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව, එහි රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ, එහි රීති මගින් විධිවිධාන යොදා ඇති පරිදි සත් දෙනකුගෙන් සමන්විත වූ කළමනාකරණ සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය. එකී කළමනාකරණ සභාවේ නිල කාලය අවුරුදු දෙකක් විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ සභාවේ ධුර දැරුවා වූ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය. එම කළමනාකරණ සභාවට පත් කළ හෝ නම් කළ සාමාජිකයකු විසින් තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට අනුකූලව ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකත්වය.

**6**. (1) සංස්ථාවේ සාමාජිකත්වය සාමාන්‍ය සාමාජිකයන් හා ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) කෙසේ වෙතත්, තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් ව, කළමනාකරණ මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් වරප්‍රසාද හා ආධීනතාවයන් සහිතව සාමාන්‍ය සාමාජිකයන් සහ ආශ්‍රිත සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට සුදුසුකම් නොලත් යම් වර්ගවල තැනැත්තන් සාමූහික සාමාජිකයන් ලෙස බඳවා ගත හැකි ය.

(3) ආශ්‍රිත සාමාජිකයන් සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන යායුතු අතර, ඔවුන් විසින් සාමාන්‍ය සාමාජිකයන් මෙන් වරප්‍රසාද භුක්ති විඳිය යුතු නමුත්, සංස්ථාවේ රැස්වීම්වල දී ඡන්දය දීමට සුදුසුකම් නොතිබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**7**. (1) (රැස්වීම් පැවැත්වීම, රැස්වීම්වල කටයුතු කරගෙන යාම, වාර්ෂික වාර්තා සකස් කිරීම ආදිය ඇතුළුව) සංස්ථාවේ කටයුතු කළමනාකරණය සඳහා ද එහි පරමාර්ථ ඉටුකිරීම සඳහා ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, යම් මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට සුදුසුකම්ලත් සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ බලාත්මකව පැවැති පදනමේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සැලකිය යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක ආකාරයට ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාව විසින් සාදන ලද කවර හෝ රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතිවල ආකාරයට වෙනස් කිරීම, එයට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සැම විට ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් දේපළ දැරීමේ හා පරිහරණය කිරීමේ බලය.

**8**. මෙම පනතේ විධිවිධානවලට යටත්ව තත් කාලයේ බලාත්මකව පවත්නා රීතිවලට සමාගම විසින්—

(අ) නිශ්චල හෝ චංචල කවර ස්වභාවයේ හෝ වර්ගයේ වූ යම් දේපළක් මිළයට ගැනීමක්, හුවමාරුවක්, ත්‍යාගයක්, රික්ථවරණයක්, අන්තිම කැමැති පත්‍රයකින් හිමිකම් දීමක් මගින් අත්පත් කර ගැනීමට හෝ සදාකල් පැවැත්මකට හෝ යම් ප්‍රකාශිත භාරයකට හෝ අන්‍යාකාරයකට යටත්ව යම් අඩු කාලසීමාවකට එය දැරීමට හෝ විහරණය කිරීමට ;

(ආ) සංස්ථාව වෙත පවරනු ලැබූ හෝ එමගින් අත්පත් කර ගනු ලැබූ හෝ දරා සිටිනු ලැබූ යම් නිශ්චල දේපළක යම් ගොඩනැගිල්ලක් සෑදීමට ; සහ

(ඇ) එවැනි යම් දේපළක් විකිණීමට, ප්‍රදානය කිරීමට, පවරා දීමට, උකස් කිරීමට, බද්දට දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට,

ශක්නුවත් විය යුතු ය.

ගාස්තු හා දායක මුදල් අය කිරීමේ බලය.

**9**. සංස්ථාව විසින් ලබාදෙන සේවාවන් සඳහා සංස්ථාව විසින් සුදුසු යයි සලකන යම් ගාස්තු සහ දායක මුදල් සාමාජිකයන්ගෙන් අයකර ගැනීමට සංස්ථාවට, හැකි අතර ම නීතියෙන් හැකියාව තිබිය යුතු ය.

**10**. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. සංස්ථාවේ ගිණුම්.

(2) සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙක් සියලුම ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාව කටයුතු කළ යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**11**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පවත්නා සියළුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, පදනමට අයවිය යුතුව ඇති සියලුම ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල්, සම්මාදම් මුදල් හා ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු හා පදනමට අයවිය යුතු ණය.

**12**. තත්කාලයේ බලාත්මකව පවත්නා සංස්ථාවේ රීතිවල දැක්වෙන විධිවිධානවල නියම කර ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු ගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13**. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**14**. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව, යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදාදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.